# ගීතයට අනුව නර්තනය නිර්මාණය.



දීකිරි දීකිරි ................
රත්නදීප ජන්ම භූමි...............
යන ගීතවලට හොඳින් සවන් දෙන්න. කීප අවස්ථාවක් ගීතය ශ්‍රවණය කිරීමෙන් එය ගායනය කරන ලද තාලය සහ එහි තේමාව සිහියට නගා ගන්න. මෙම ගීත අනුව නර්තන නිර්මාණයේ දී ඔබ කලින් උගත් චලන විධික්‍රම පිළිබඳ අවධානය යොමු කිරීම වඩාත් යෝග්‍ය ය.

1. රිද්මානුකූල චලන
2. තාලානුකූල චලන
3. ප්‍රකාශනාත්මක චලන



**නර්තන නිර්මාණය සඳහා උපදෙස්**

- ගීතය හොඳින් ශ්‍රවණය කරන්න.
- ගීතයේ අදහස/රිද්මය/තාලය අනුව ඔබ කැමති චලන නිර්මාණය කරගන්න.
- ගීතයේ අදහස නිරූපණය කරන්නේ නම් මුහුණේ ඉරියවු වෙනස් විය යුතු ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.
- ගීත ගායනයේ දී අතරතුර වාදනය වන සංගීත ඛණ්ඩ පිළිබඳ ව අවධානය යොමු කරමින් ඒ සඳහා ද සුදුසු චලන නිර්මාණය කර ගන්න.
- නර්තන නිර්මාණයේ දී අවකාශ භාවිතය, දිසා හා තල භාවිතය, රංග රටා භාවිත කරන්න.